// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2401/44 - 2024 සැප්තැම්බර් මස 14 වැනි සෙනසුරාදා - 2024.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44(vi) ඒ

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වන නියමය

“සරණ සංවර්ධන” භාරයෙ හි භාරකරුවන්, එනම් -

1. සභාපති සිවගුරුනාදන්;
2. මහින්ද හත්තක;
3. නිමල් ගාර්දිය පුංචිහේවා;
4. තුඩුගල මුදලිගේ ග්‍රෙහරි විමල් ප්‍රනාන්දු;
5. තපස්සර මුහන්දිරම්ලාගේ ප්‍රේමවර්ධන; සහ
6. හෙට්ටි වත්තගේ සුමනා ආරියදාස

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා, වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 114 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය එම්.යු.එම්. අලි සබ්රි වන මම, මේ නියමය මගින් එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය පවරන අතර -

(අ) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, “සුජාතා කුමාරි කුලතුංග” විසින් සහතික කරන ලද 2020 සැප්තැම්බර් මස 3 වන දිනැති අංක 1108 දරන භාර ඔප්පුව මගින් සංශෝධිත ප්‍රසිද්ධ නොතාරිස්, බෝපිටිය ගමගේ නීල් ගුණසේකර විසින් සහතික කරන ලද. 2011 අගෝස්තු මස 16 වන දිනැති අංක 682 දරන භාර ඔප්පුව යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් “සරණ සංවර්ධන භාරය” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු යයි ද;

1A - G 42758 — 05 (2024/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ, එකී භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම, භාරගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද; සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩු කටයුතුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක ඕනෑම අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, හෝ අවශ්‍ය යයි මා හට පෙනී යන ආකාරයට කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මා විසින් කරනු ලැබිය හැකි ය.

**එම්.යූ.එම්. අලි සබ්රි,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අමාත්‍ය.

2024 සැප්තැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0185

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.